සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය
நீதியான சமுதாயத்திற்கான தேசிய இயக்கம்
National Movement for Social Justice

අංක 74, කිරුළපන ඇවනිව්, කොළඹ 05
இல 74, கிரலப்பனை அவென்யூ கொழும்பு 05
No 74, Kirulapone Avenue, Colombo 05

0112512992 /0777751092 /0778021761
nmsjoffice2023@gmail.com



මාධ්‍ය නිවේදනය | Press Release | ஊடக வெளியீடு | 2024/07/02

**රටේ උද්ධමනය පහළ බසින තත්ත්වයක් තුළ ද එහි වාසිය පාරිභෝකයාට නොලැබීම ගැන නොපමාව ම සොයා බැලිය යුතුව තිබේ.**

ශ්‍රී ලංකාවේ උද්ධමනය 1.7% දක්වා අඩුවීම ඉතා යහපත් හා සතුටු විය හැකි තත්ත්වයක් වුව ද එවන් තත්ත්වයක් යටතේ රටේ පාරිභෝගික ජනතාවට ලැබිය යුතු සහන නෙලෙබෙන්නේ ඇයි ද යන්න අදාල අංශ නොපමාව ම අවධානය යොමු කල යුතුව ඇති බව සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය අවධාරණය කරනු කැමැත්තෙමු.

යහපත් කළමනාකරණයක් හා නියාමන යාන්ත්‍රණ පවත්වාගෙන යන ලොව ඕනෑම සමාජයක උද්ධමනය පහළ බසින්නා වූ තත්ත්වයක එහි සහනය පාරිභෝගිකයන් වෙත හිමිවීම සහතික කෙරේ. එහෙත් අවාසනාවකට ශ්‍රී ලංකාවේ බොහෝ පාරිභෝගික ද්‍රව්‍යවල නිෂ්පාදන හා ආනයනික වියදම සහ විකුණුම් මිල අතර විශාල පරතරයක් දක්නට තිබේ. සමහර භාණ්ඩවලට අදාලව එකී පරතරය 100%ත් 200%ත් අතර වන තරම් ඉතා ඉහළ අගයක පවතින බව දැකගත හැකිය. එය ඉතාමත් අසාධාරණ හා අයුක්ති සහගත තත්ත්වයකි.

මෙවැනි තත්ත්වයක් ඇතිවිමට හේතුව පාරිභෝගික අයිතින් ආරක්ෂා කිරීම සඳහා ස්ථාපිත ආයතන තම වගකීම හා කාර්ය භාර්ය ක්‍රියාත්මක නොකිරීම මෙන් ම සාධාරණ මිල යාන්ත්‍රණයක් සහතික කිරීමට ඇති කරගත යුතුව තිබෙන නියාමන හා මැදිහත්වීමේ යාන්ත්‍රණ ගැන රටේ වගකිව යුතු අංශ නිසි අවධානයක් යොමු නොකිරීම ද දැක්විය හැකිය. එබැවින් අප ශ්‍රී ලංකාවේ වගකිව යුතු ආයතනවලින් ඉල්ලා සිටින්නේ නොපමාව ම ඒ ගැන අවධානය යොමු කරමින් වෙළඳපොළ සක්‍රීයතාවය මෙන් ම පාරිභෝගිකයාගේ අයිතින් ආරක්ෂා කරන නිසි වැඩපිළිවෙළකට යොමු වන ලෙසට ය.

සුනිල් ජයසේකර
මහලේකම්
සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය.